## 2.4. නූතන ලෝකය තුළ කිතුනු විවාහය




- ඉහත සඳහන් විවාහ පොරොන්දු හොඳින් කියවන්න.
- එහි අඩංගු වන ප්‍රධාන අදහස් මොනවා ද?
- විවාහ පොරොන්දුව ඉටු කිරීමට බැඳෙන්නෝ කව්රු ද?
- මනාල යුවල විවාහ පොරොන්දුව ඉටු කිරීමට බැඳෙන්නේ කොපමණ කාලයකට ද?
- මෙම පොරොන්දුව කොන්දේසි විරහිත බව පෙන්නුම් කරන වචන මොනවා ද?


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**විවාහය යනු:**

එකිනෙකාට වෙනස් වූ, එහෙත් එකිනෙකාගේ කැමැත්ත ඇත්තා වූ දෙදෙනෙක් දරුඵල ලැබීමේ හා එකට එක් වී ජීවත් වීමේ අරමුණින් කායික ව හා මානසික ව තමා අනෙකාට සම්පූර්ණයෙන් ම ප්‍රදානය කිරීමටත් අනෙකා සම්පූර්ණයෙන් ම භාර ගැනීමටත් ගිවිස ගැනීම ය.

**ආශිර්වාදකාර බන්ධනය යනු:**

ස්ත්‍රිය හා පුරුෂයා එක් ව තම යහපත සඳහා සහ දරු සම්පත් ලබා ඔවුන්ට නිසි අධ්‍යාපනය දීම සඳහා සදාකාලික කොටස්කරුවන් වශයෙන් බැඳෙන්නා වූ ද; ක්‍රිස්තියානීන් දෙදෙනකු පාර්ශ්වකරුවන් වන විට, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් ප්‍රසාද නිධාන තත්ත්වයට උසස් කරනු ලබන්නා වූ ද යාවජීව ගිවිසුමකි.

**(සභා නීතිය 1055)**

**දෙවියන් වහන්සේ පළමු මිනිසා වන ආදම් මවා**

"මිනිසා තනි ව විසීම සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි."

(උත්පත්ති 2:18)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දෙවියන් වහන්සේ ම විවාහය ස්ථාපිත කළ සේක.

● **කියවන්න මෙනෙහි කරන්න.**

උත්.2:20-23

විවාහ බන්ධනයේ ස්ථාවරවත්වය පිළිබඳ ව ක්‍රිස්තුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නො කෙරේවා."
(මාක් 10:9)

අනෙක් ප්‍රසාද නිධාන මෙන් නොව ආශිර්වාදකාර බන්ධනය දානය කරනු ලබන්නේ විවාහ අපේක්ෂක යුවළ විසින් ඔවුන් එකිනෙකාට ය.

පූජා ප්‍රසාදිතුමා සභාවේ නිල සාක්ෂිකරුවා ය. එතුමා ක්‍රිස්තුන් වහන්සේගේ දෘශ්‍යමාන නියෝජිතයා වශයෙන් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය දානය කරයි.



● **ආශිර්වාදකාර බන්ධනය ලබන මෙම යුවළට ජීවිතාන්තය දක්වා ම**

- අඹු සැමියන් ලෙස ජීවත්වීමට.
- දුක්බර හා ප්‍රීතිමත් අවස්ථාවන්ට මුහුණ දීමට.

- තමන් වෙත පැවරෙන වගකීම් ඉටු කිරීමට.
- ප්‍රේමයෙන් හා විශ්වාසවන්ත ව විසීමට.
- එකිනෙකාට අවංක වීමට හා විවෘත වීමට.
- පතිවත සහ පතිනිවත රැකගෙන විශ්වාසයෙන් ජීවත්වීමට.
- අනෙකාට විරුද්ධව සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් හෝ අතපසු කිරීමෙන් වරදක් නොකිරීමට.
- විවාහයේ ශුද්ධවන්ත බව සුරැකීමට.

**දේව වරප්‍රසාද ලබාදෙමින් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ඔවුන් සමග ජීවත්වන සේක. ඔවුන් දිරි ගන්වමින්, මග පෙන්වමින්, ආසිරි ගන්වන සේක.**

- **විවාහය දේව ප්‍රසාද නිධානයක් බවට පත්වීමට සම්පූර්ණ විය යුතු ප්‍රධාන කරුණු සොයා ලියන්න.**

**කතෝලිකයන් දෙදෙනෙකු අතර ඇතිවන විවාහය සාමාන්‍යයෙන් දිව්‍ය පූජා වේලාවේ දී සිදු වේ. තම මනාලිය වූ කිතුනු සභාවට ක්‍රිස්තුන් වහන්සේ විසින් දානය කරන ලද නව ගිවිසුමේ දීමනාව දිව්‍ය සත්ප්‍රසාදයයි.**

**ඒ නිසා එකිනෙකාට දක්වන ප්‍රේමය තුළ එකමුතු වන මනාල යුවළ තම විවාහ ගිවිසුම දිව්‍ය පූජා යාගය සිදු වන මොහොතේ සිදු කර අවශේෂ කිතුනු සංසය සමග උන්වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය ලබා ගැනීම ඉතා වටනේ ය.**

**විවාහ වන දෙදෙනා එකිනෙකාට මේ දේව ප්‍රසාද නිධානය දානය කරයි. කිතුනු සංසය ඉදිරිපිට එකිනෙකා තම කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් මෙම ප්‍රසාද නිධානය ලබාගනී.**

**(ක.ස.ධ. 1621)**

"මිනිසකු තම පියා ද මව ද අතහැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින් ය. මෙලෙස ඔවුහු එක් කෙනෙක් වන්නෝ ය."

(උත්පත්ති 2:24)

- **කියවන්න, අවබෝධ කරගන්න.**

**මතෙව් 19:5-6, මාක් 10:6-9**

**එහෙයින් විවාහ ගිවිසුමෙන්**
**එක ම මාංශය වන්නා වූ**
**පුරුෂයා හා භාර්යාව**
**තම තමන්ගේ ක්‍රියා අතරේ**
**ඉතා කිට්ටු සම්බන්ධකමක් ඇති කරගෙන**
**අන්‍යෝන්‍ය වශයෙන්**
**උපකාරය හා සේවය දෙන්නෝ ය.**

**මෙම ඒකාබද්ධකම ගැන හැඟීමක් ඇති ව**
**දිනෙන් දින එය වඩාත් සම්පූර්ණ කර ගැනීමට**
**උත්සාහ කරන්නෝ ය.**

**පුද්ගලයින් දෙදෙනකුගේ අන්‍යෝන්‍ය පරිත්‍යාගය වන**
**මෙම කිට්ටු ඒකත්වය ද දරුවන්ගේ යහපත ද ගැන**
**කල්පනා කරන විට**
**අඹු සැමි දෙදෙනා අතරේ සම්පූර්ණ විශ්වාසකමක් ද**
**නොකැඩිය හැකි ඒකාබද්ධ කමක් ද**
**ඇතිවිය යුතු බව පෙනී යේ.**

**(වර්තමාන ලෝකයේ**
**ශුද්ධ වූ සභාව - 48)**

මනුෂ්‍යයා සම්පූර්ණ වන්නේ පුරුෂයා හා ස්ත්‍රියගේ එක්වීම තුළින් ය. නොහොත් එකම මාංශයක් මෙන් ජීවත් වීමෙන් ය. වෛවාහික ප්‍රේමය අති විශිෂ්ඨ ලෙස ප්‍රකාශ වන්නේ වෛවාහික සම්භෝගයෙන් ය. මෙය මාංශික ඇල්ම ම නොවේ. මාංශික ඇල්ම තාවකාලික ය. මෙම ප්‍රේමය වචන හා ක්‍රියාවලට සීමා නොවේ. විවාහක යුවළ තුළ ඇති මෙම ගැඹුරු ප්‍රේමය ශුද්ධ වූ පාවුලුතුමා සමාන කර ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ හා ශුද්ධ වූ සභාව අතර ඇති බැඳීමට ය.

"මේ නිසා මිනිසෙක් තම පියා ද මව ද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙන එක් කෙනෙක් වන්නෝ ය. මෙය මහා අභිරහසකි. මට හැඟෙන පරිදි එය අදාල වන්නේ ක්‍රිස්තුන් වහන්සේට හා සභාවට ය. එහෙත් එය පෞද්ගලික වශයෙන් ඔබටත් අදාළ වන්නේ ය. හැම පුරුෂයකු ම තමාට මෙන් ම තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය. හැම භාර්යාවක්ම තම ස්වාමි පුරුෂයාට ගෞරව දැක්විය යුතු ය."

(එපීස 5:31-33)

දෙවියන් වහන්සේ විසින්, ඔවුන්වහන්සේගේ සමානකමට මවනු ලැබූ මිනිසා මැවීමේ කාර්යයට හවුල් කරගත් සේක. විවාහය තුළ ලිංගික ක්‍රියාවලිය මගින් එම කාර්යය සම්පූර්ණ වේ. එම නිසා ම මෙම වෛවාහික ක්‍රියා ඉතා උසස් ලෙස හා ශුද්ධවත් ලෙස සැලකිය යුතු ය.

- **කුඩා කණ්ඩායම් සෑදී පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න. ඒවා අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.**

  - විවාහ ජීවිතයේ ශුද්ධවන්ත බව විනාශ කරමින්, පවුල් ජීවිත කඩා කප්පල් කරන, නූතන සමාජය තුළ ඇති බලවේග මොනවා ද?

  - කිතුනු පවුලට එල්ල වන අභියෝග අනාගතයේ දී ඔබ ජය ගන්නා අයුරු සාකච්ඡා කර අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

- **කියවන්න, මෙනෙහි කරන්න.**

මතෙව් 19:8-9, මාක් 10:1-12, ලූක් 16:18


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**විවාහය සඳහා**
**සූදානම් වීම ඉතා වැදගත් ය.**
**එකිනෙකා ප්‍රකාශ කරන කැමැත්ත සත්‍ය වූ ද,**
**වගකිව යුතු එකක් වන්නේ ඒ පිළිබඳ හොඳ**
**අවබෝධයක් ලබා ගැනීමෙනි. විවාහ ජීවිතය සඳහා**
**සූදානම් වන අය දැනුවත් කිරීමේ සැසි වාර පැවැත්වීම සඳහා**
**විවාහ වූ අය ඉතා සුදුසු වෙති. විවාහ ජීවිතයේ ඇති**
**දුක් කම්කටොළු, ප්‍රීති සන්තෝෂ හා ගැටලු යනාදිය ගැන**
**මනා අත්දැකීමක් ඔවුහු ලබා ගනිති.**

**(ක.ස.ධ. 1621)**

**පවුල් ජීවිතයේ ස්ථාවර බව රැකගැනීම සඳහා ශුද්ධ වූ සභා මාතාව එතුමියගේ දරුවන් දැනුවත් කරමින් ඇවැසි උදව් උපකාර සපයා දෙන්නී ය.**

**ඒවා නම් :**

- **විවාහයට පෙරඃ**
  - දේව කැඳවීම් තේරුම් ගැනීමේ වැඩසටහන් (තරුණ, තරුණියන්ට)
  - විවාහ අපේක්ෂක සමුළු පැවැත්වීම. එයට සහභාගි වීම අනිවාර්ය කිරීම (විවාහයට සූදානම් වන තරුණ තරුණියන්ට)

- **විවාහයට පසු:**
  - යුග දිවි පෝෂණ වැඩ මුළු (මීසම් හා දිසා මට්ටම්වලින්)
  - මව්පිය අධ්‍යාපන වැඩසටහන්
  - පවුල් සංවිධාන උපදෙස්
  - පවුල් උපදේශන (පවුල්වල විවිධ ගැටලු නිරාකරණයට සහාය වීම)
  - මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් මුදා ගැනීම
  - පවුල් දිවිය පෝෂණය කිරීම සඳහා ඇති අපෝස්තලික සංවිධාන
  - විවාහ හමුව
  - ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය

**ඔබගේ දැන ගැනීම සඳහා..**

- මෙවැනි වැඩසටහන් ඔබගේ මීසමේ, දිසාවේ, පදවියේ තිබේ ද යි සොයා තොරතුරු රැස් කරගන්න.
  (ඔබගේ මීසමේ පියතුමාගෙන්, දහම් ගුරුවරුන්ගෙන්, පැවිදි සොහොයුරු සොහොයුරියන්ගෙන් මේ පිළිබඳ ව කරුණු දැනගත හැකි ය.)

- පවුල් දිවියට උදව් ලබා ගත හැකි වැඩසටහන්වල සහාය අවශ්‍ය පවුල් ඔබ ප්‍රදේශයේ සිටිනවා ද?

- එම උදව් ලබා දීමට ඔවුන් යොමු කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග කල්පනා කරන්න.

- කිතුනු සිසුවකු වන ඔබට ඒ සඳහා ක්‍රියාත්මක විය හැකි ය. මීසමේ පියතුමාගේ සහ දහම් ගුරුවරුන්ගේ සහාය ලබාගෙන සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

- විවාහය ගිවිසුමකි. ස්වාමි පුරුෂයා සහ භාර්යාව සිය නිදහස් කැමැත්තෙන් එයට බැඳේ.

- කතෝලික විවාහය සක්‍රමේන්තුවකි. එය ආශිර්වාදකාර බන්ධනය නමැති ප්‍රසාද නිධානයයි.
  එය දානය කරනු ලබන්නේ විවාහ පත් වන යුවල ඔවුන් ඔවුන් ම ය. පූජාප්‍රසාදි තුමා සහ සෙසු ජනතාව සාක්ෂිකරුවන්ය.

- කතෝලික විවාහය දික්කසාද කළ නො හැක. රජයට හෝ උසාවියට හෝ කතෝලික විවාහය අවලංගු කළ නො හැක.

- කතෝලික විවාහයට ලේ නෑකම් හා විවාහ නෑකම් බලපාන බාධාවන් ය.

- විවාහයට ඇතුල්වීමට ශාරීරික ව හා මානසික ව පරිනත පුද්ගලයින් විය යුතු ය. තම දරුවන් හදා වඩා ගැනීමට හැකියාව හා දැනුම ඇති පුද්ගලයින් විය යුතු ය.

**ඔබගේ මතකයට..**

**විවාහ ජීවිතය ශුද්ධ වූ බන්ධනයකි. එය කිසිවකුට වෙන් කළ නොහැකි ය.**

ගි වි සු ම

දෙවියන් වහන්සේ සහ ඊශ්‍රායෙල් ජනතාව



ස්වාමිපුරුෂයා සහ භාර්යාව



ජේසුස්වහන්සේ සහ ශුද්ධ වූ සභාව

